සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II
முயற்சியாண்மைக் கற்கை I, II
Entrepreneurship Studies I, II

2019.12.12 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** සාර්ථක ව්‍යවසායකයකු වන සුමිත් ධනංජය පවසන්නේ ඔහුගේ ළමා කාලයේ සිට ම අලුත් දෙයක් කිරීමට තමා නිතරම උත්සාහ කළ බවයි. මේ තුළින් ප්‍රකට වන ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ
(1) කැපවීමයි. (2) නම්‍යශීලීත්වයයි.
(3) අවදානම් දැරීමයි. (4) නිර්මාණශීලීත්වයයි.

**2.** සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු වන චතුර රණසිංහ වාර්ෂිකව ළමා නිවාසයක දරුවන් සඳහා අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කරයි. මේ තුළින් ව්‍යවසායකයකු ලෙස ඔහු
(1) ආර්ථික සංවර්ධනයට දායක වේ. (2) තම ව්‍යාපාරය ජනප්‍රිය කරවයි.
(3) සමාජයීය සුභසාධනය සඳහා දායක වේ. (4) සමාජයීය පිළිගැනීමක් ඇති කරවයි.

**3.** මානව අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා වන ඕනෑම ආර්ථික කටයුත්තක් පොදුවේ අර්ථ දැක්විය හැක්කේ
(1) වෙළෙඳපොළක් ලෙස ය. (2) තරගකරුවන් ලෙස ය.
(3) ව්‍යාපාරයක් ලෙස ය. (4) කර්මාන්තයක් ලෙස ය.

**4.** 'නව්‍යතා සම්පාදනය' දිරිගන්වනු ලබන සාධකයක් වන්නේ
(1) අසාර්ථකත්වයන් අත්දැකීම් ලෙස සැලකීම ය.
(2) සමාජ සම්මතයන් හා සම්ප්‍රදායන් අනුව කටයුතු කිරීම ය.
(3) නිර්මාණශීලී අදහස් ක්ෂණිකව ක්‍රියාත්මක කිරීම ය.
(4) සෑම ගැටලුවක් සඳහා ම එක විසඳුමක් පමණක් සෙවීම ය.

**5.** සිරිපාලගේ ව්‍යාපාරය අසාර්ථක වීම නිසා ඔහුගේ බැංකු ණය මුදල් ගෙවීම සඳහා තම පෞද්ගලික නිවාසය වෙන්දේසි කර මුදල් ලබා ගැනීමට උසාවි නියෝගයක් නිකුත් කිරීමට හේතුව වන්නේ
(1) ව්‍යාපාරයෙහි ණය මුදල් සඳහා සිරිපාල වගකිව යුතු වීම ය.
(2) රටේ සිවිල් නීතිය ව්‍යාපාර සඳහා ද අදාළ වීම ය.
(3) ව්‍යාපාරය සඳහා නෛතික පුද්ගලභාවයක් නොමැති වීම ය.
(4) බැංකු ආරක්ෂා කිරීම රජයේ වගකීමක් වීම ය.

**6.** අතීතයේ පැවති ව්‍යාපාර පරිසරයට වඩා වර්තමානයේ දැකිය හැකි ප්‍රධාන වෙනස්කම් වන්නේ
(1) වුවමනා සරලවීම, කළමනාකරුවන් බලවත්වීම හා පාරිභෝගිකයින් බලවත් නොවීම ය.
(2) වුවමනා සංකීර්ණවීම, තරගකාරිත්වය වැඩිවීම හා පාරිභෝගිකයින් බලවත් වීම ය.
(3) වුවමනා සංකීර්ණවීම, නිෂ්පාදන සරලවීම හා ලාභයට ප්‍රමුඛත්වය දීම ය.
(4) වුවමනා සරලවීම, ව්‍යාපාර ශක්තීන් වැඩිවීම හා ලාභයට ප්‍රමුඛත්වය දීම ය.

[දෙවැනි පිටුව බලන්න.

7. කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය **නොහැකි** ලක්ෂණයක් වන්නේ
 (1) නවීන තාක්ෂණය පහසුවෙන් භාවිත කළ හැකි වීම ය.
 (2) සේවකයන් බඳවා ගැනීම හා පුහුණුකිරීම පහසු වීම ය.
 (3) කුඩා ප්‍රාග්ධනයකින් වුව ද ව්‍යාපාරය ආරම්භ කළ හැකි වීම ය.
 (4) ව්‍යාපාර කටයුතු සඳහා පවුලේ සාමාජිකයින්ගේ දායකත්වය ලබා ගත හැකි වීම ය.

8. ව්‍යවසායකයකුට පරිසර විශ්ලේෂණයකින් ලබා ගත හැකි ප්‍රයෝජනයක් වන්නේ
 (1) පාරිභෝගිකයින් ව්‍යාපාරයට ආකර්ෂණය කරගත හැකි වීම ය.
 (2) දක්ෂ සේවකයින් ආයතනයට ආකර්ෂණය කරගත හැකි වීම ය.
 (3) ව්‍යාපාරයක කළමනාකරණ කටයුතු පහසුවෙන් කළ හැකි වීම ය.
 (4) පරිසර වෙනස්වීම්වලට ගැළපෙන පරිදි සැලසුම් හා උපායමාර්ග සකස් කළ හැකි වීම ය.

9. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන සාධකයක් වන්නේ
 (1) පාරිභෝගිකයින් ය. (2) අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් ය.
 (3) භෞතික සම්පත් ය. (4) තරගකරුවන් ය.

10. ව්‍යවසායකයකුගේ භූමිකා අතුරෙන් 'අයිතිකරු' භූමිකාවේ කාර්යයක් වන්නේ
 (1) ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම ය.
 (2) ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් සැපයීම ය.
 (3) සේවකයින් පෙළඹවීම හා අවශ්‍ය මග පෙන්වීම ය.
 (4) මානව සම්පත් ව්‍යාපාරයේ විවිධ කාර්ය සඳහා මෙහෙයවීම ය.

11. වර්තමානයේ කාන්තාවන් ව්‍යවසායකත්වය සඳහා යොමු වීම අවශ්‍ය වන්නේ
 (1) ව්‍යාපාර සංවර්ධනයට රුකුලක් වන නිසා ය.
 (2) කාන්තා දායකත්වය අවශ්‍යවන ව්‍යාපාර පැවතීම නිසා ය.
 (3) ණය ලබාගැනීම පහසු නිසා ය.
 (4) සාර්ථක ව්‍යවසායකයින් ලෙස සම්මාන ලබා ගැනීම පහසු නිසා ය.

12. ව්‍යාපාරය සමස්තයක් ලෙස සලකමින් අනාගතයේදී ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම, ඒවා වැඩි දියුණු කිරීම හා අවශ්‍ය උපායමාර්ග තීරණය කර ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ව්‍යවසායකයාට ඇති හැකියාවන් හැඳින්වෙන්නේ
 (1) උපදේශන කුසලතා ලෙස ය. (2) සංකල්පනාත්මක කුසලතා ලෙස ය.
 (3) මානව කුසලතා ලෙස ය. (4) සන්නිවේදන කුසලතා ලෙස ය.

13. ව්‍යාපාර සංවිධානයක් ක්‍රීඩා සමාජයකට අවශ්‍ය උපකරණ ලබාදෙයි. මේ තුළින් ඉටු කරනුයේ
 (1) ආර්ථික වගකීමකි. (2) නීතිමය වගකීමකි.
 (3) සදාචාරාත්මක වගකීමකි. (4) පරාර්ථකාමී වගකීමකි.

14. ව්‍යාපාරයක තරගකරුවන් විසින් ස්වකීය උපායමාර්ග වෙනස් කරනු ලබයි. ව්‍යාපාර සම්බන්ධයෙන් මෙය සැලකිය හැක්කේ
 (1) තර්ජනයක් ලෙස ය. (2) අවස්ථාවක් ලෙස ය. (3) ශක්තියක් ලෙස ය. (4) ආදේශනයක් ලෙස ය.

15. ලොව පුරා රටවල් දේශ සීමාවන්ගෙන් තොරව බද්ධ වී කටයුතු කිරීමේ ප්‍රවණතාවයක් වර්තමානයේ දක්නට ලැබේ. මෙම ප්‍රවණතාවය සම්බන්ධ වන්නේ
 (1) ආර්ථික පරිසරයට ය. (2) ප්‍රජා පරිසරයට ය.
 (3) තරගකාරී පරිසරයට ය. (4) ගෝලීය පරිසරයට ය.

16. ව්‍යාපාර ආචාර ධර්ම,
 (1) ව්‍යාපාරයක ඇල්මැති පාර්ශ්වයන්ගේ වගකීමකි.
 (2) ව්‍යාපාර සංවිධානයේ නීතිමය හා ප්‍රතිපත්තිමය වගකීමකි.
 (3) ව්‍යාපාර හිමිකරුගේ වගකීමකි.
 (4) තිරසාර ව්‍යාපාර සංවිධානයක වගකීමකි.

17. ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය, හිමිකාරිත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ තොරතුරු ඇතුළත් වන්නේ
 (1) සංවිධාන සැලැස්මෙහි ය. (2) පරිපාලන සැලැස්මෙහි ය.
 (3) විධායක සැලැස්මෙහි ය. (4) මූල්‍ය සැලැස්මෙහි ය.

18. ව්‍යාපාර කටයුතුවලට බලපෑම් කරනු ලබන සියලු ම සාධකවල එකතුව හඳුන්වනු ලබන්නේ
 (1) ව්‍යාපාර පරිසරය ලෙස ය. (2) අභ්‍යන්තර පරිසරය ලෙස ය.
 (3) ප්‍රජා පරිසරය ලෙස ය. (4) බාහිර පරිසරය ලෙස ය.

[තුන්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**19.** ව්‍යාපාර සංවිධානයක පොදු ලක්ෂණයක් වන්නේ
(1) ලාභ ඉපයීම ය. (2) ව්‍යාපාරය කළමනාකරණය කිරීම ය.
(3) පොදු අරමුණක් පැවතීම ය. (4) භාණ්ඩ නිෂ්පාදනය කිරීම ය.

**20.** ව්‍යාපාරයක කළමනාකරුවකු වන අමල් මෑතදී නව නිෂ්පාදිතයක් වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. ඔහු
(1) ව්‍යාපාර ව්‍යවසායකයෙකි. (2) සමාජයීය ව්‍යවසායකයෙකි.
(3) ආයතනික ව්‍යවසායකයෙකි. (4) නිෂ්පාදන ව්‍යවසායකයෙකි.

**21.** බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) තාක්ෂණය, වෙළෙඳපොළ හා පොලී අනුපාත
(2) ව්‍යාපාර ස්ථානය, ජාතික ආර්ථිකය හා සංවිධාන ව්‍යුහය
(3) ජාත්‍යන්තර වෙළෙඳපොළ, දේශපාලන ස්ථාවරත්වය හා සංවිධාන ව්‍යුහය
(4) සන්නිවේදනය, උපායමාර්ග හා සංවිධාන ව්‍යුහය

**22.** තනි පුද්ගලයකුට හෝ කිහිපදෙනෙකුට ද ආරම්භ කළ හැකි නෛතික පුද්ගලභාවයක් හා අඛණ්ඩ පැවැත්මක් ඇති ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ
(1) හවුල් ව්‍යාපාර ය. (2) කේවල ස්වාමී ව්‍යාපාර ය.
(3) වරලත් ව්‍යාපාර ය. (4) සංස්ථාපිත සමාගම් ය.

**23.** සැලසුම් සකස් කිරීම හා සම්පත් මෙහෙයවීම අයත් වන්නේ
(1) අයිතිකරුගේ භූමිකාවට ය. (2) නායකයාගේ භූමිකාවට ය.
(3) කළමනාකරුගේ භූමිකාවට ය. (4) උපදේශකගේ භූමිකාවට ය.

**24.** විස්තරාත්මක ව්‍යාපාර සැලසුමකින් නිරූපණය වන්නේ
(1) ආයෝජකයින්ගේ ආයෝජන තීරණ ය.
(2) මූල්‍ය තොරතුරු, නිෂ්පාදන තොරතුරු හා ව්‍යාපාර ප්‍රතිපත්ති ය.
(3) අයිතිකරු ප්‍රාග්ධනය සපයාගත් ආකාරය හා ඔහුගේ අලෙවිකරණ ප්‍රතිපත්ති ය.
(4) ව්‍යාපාරයේ සමස්ත කටයුතු මෙහෙයවනු ලබන ආකාරය ය.

**25.** නිෂ්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ මූලික අරමුණ වන්නේ, අපේක්ෂිත
(1) මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම ය. (2) මුළු භාණ්ඩ පිරිවැය ගණනය කිරීම ය.
(3) මුළු ඉල්ලුම් පිරිවැය ගණනය කිරීම ය. (4) මුළු අලෙවි පිරිවැය ගණනය කිරීම ය.

**26.** භාණ්ඩ ඇසුරුම්කරණය සඳහා යොදා ගන්නා විදුලි ආලෝකය,
(1) සෘජු ද්‍රව්‍ය පිරිවැයකි. (2) වක්‍ර ද්‍රව්‍ය පිරිවැයකි.
(3) වෙනත් නිෂ්පාදන පිරිවැයකි. (4) වෙනත් ද්‍රව්‍ය පිරිවැයකි.

**27.** තම වෙළෙඳ නාමය යටතේ භාණ්ඩ හා සේවා අලෙවි කිරීමට වෙනත් පාර්ශ්වයකට අවසරය ලබා දෙන පාර්ශ්වය හඳුන්වනු ලබන්නේ
(1) නිෂ්පාදකයා ලෙස ය. (2) සැපයුම්කරු ලෙස ය.
(3) කළමනාකරු ලෙස ය. (4) වරලත්හිමියා ලෙස ය.

**28.** වර්තමානයේ බැංකු ගිණුමක සිදුවන ගනුදෙනු පිළිබඳ තොරතුරු ජංගම දුරකථනයක් මගින් දැනගැනීම සඳහා ලබා දී ඇති සේවාව,
(1) නව සොයා ගැනීමකි. (2) දිගුවකි.
(3) අනුකරණය කිරීමකි. (4) සංකලනයකි.

**29.** රටක ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහිකිරීමේදී එයට බාධා වන සමාජයීය සාධකයක් වන්නේ
(1) ලාභ ලැබීමේ අරමුණ ය.
(2) පුද්ගල ආකල්ප ය.
(3) ජනතාවගේ ඉහළ අධ්‍යාපන සුදුසුකම් ය.
(4) වැටුප් ලබන රැකියාවකට දෙනු ලබන ඉහළ පිළිගැනීම ය.

**30.** ව්‍යාපාර සැලසුම්කරණයට අදාළ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
A - ව්‍යාපාර සැලැස්මක් තුළින් අභ්‍යන්තර හා බාහිර පරිසර තත්ත්වයන් නිශ්චිත වශයෙන්ම පුරෝකථනය කළ හැකි ය.
B - ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දැරූ වියදම් මුළු ආයෝජනය පිරිවැය ඇස්තමේන්තු කිරීමේදී සැලකිල්ලට ගනු නොලැබේ.
ඉහත ප්‍රකාශන සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A හා B නිවැරදි වේ. (2) A හා B වැරදි වේ.
(3) A නිවැරදි වන අතර B වැරදි වේ. (4) A වැරදි වන අතර B නිවැරදි වේ.

[හතරවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**31.** ABC පෞද්ගලික සමාගම 'දිමුතු' නමින් දන්තාලේප වර්ගයක් නිෂ්පාදනය කරන අතර ඊට සමාන විවිධ වර්ගයේ දන්තාලේප නිෂ්පාදිත ද වෙළෙඳපොළ තුළ අලෙවි කෙරේ. මෙයින් පෙන්නුම් කෙරෙන්නේ
(1) තරගකාරිත්ව ය. (2) වෙළෙඳපොළ ව්‍යුහය ය.
(3) භාණ්ඩ ප්‍රවර්ධන ය. (4) නිෂ්පාදන හැකියාවන් ය.

**32.** කාන්තාවන් සඳහා විශේෂිත වූ ආලේපන වර්ගයක් නිෂ්පාදනය කරන සීමාසහිත 'බියුටි' පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂතුමිය මෙම ආයතනය පිළිබඳ රූපවාහිනී සාකච්ඡාවක් පැවැත්වූවා ය. මෙය හැඳින්විය හැක්කේ
(1) ප්‍රවර්ධන උපාය මාර්ගයක් ලෙස ය. (2) නිෂ්පාදන උපාය මාර්ගයක් ලෙස ය.
(3) වෙළෙඳපොළ උපාය මාර්ගයක් ලෙස ය. (4) භාණ්ඩ සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ය.

**33.** නව ව්‍යාපාරයක් සඳහා වඩාත් සාර්ථක පිවිසුම් උපාය මාර්ගයක් වන්නේ
(1) තරගකරුවකුගේ නිෂ්පාදිතයක් එලෙසම ඉදිරිපත් කිරීම ය.
(2) තරගකරුවකුගේ නිෂ්පාදිතයකට ආදේශකයක් ඉදිරිපත් කිරීම ය.
(3) ආනයනික නිෂ්පාදිතයක් ඉදිරිපත් කිරීම ය.
(4) නවෝත්පාදනය තුළින් නව නිෂ්පාදිතයක් ඉදිරිපත් කිරීම ය.

**34.** ව්‍යාපාරයක අයිතිකරුගේ කැමැත්ත මත සේවකයින් බඳවා ගැනීම, ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම සහ භාණ්ඩවල මිල තීරණය කිරීම වැනි මෙහෙයුම් තීරණ ගත හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ
(1) පෞද්ගලික සමාගම් ය. (2) හවුල් ව්‍යාපාර ය.
(3) ලාභය අරමුණු කර නොගත් ව්‍යාපාර ය. (4) තනි/කේවල ස්වාමි ව්‍යාපාර ය.

**35.** රංග ගල්කැඩීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඔහු අවසර ලබාගත යුතු ආයතනයක් වන්නේ
(1) ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියයි.
(2) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයයි.
(3) කාර්මික සංවර්ධන මණ්ඩලයයි.
(4) කාර්මික තාක්ෂණික ආයතනයයි.

**36.** හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණයක් වන්නේ
(1) අවදානම් දැරිය හැකි වීම ය.
(2) ක්ෂණිකව ලාභ ඉපයිය හැකි වීම ය.
(3) වෙනස්වන අවශ්‍යතා හා වුවමනාවලට ප්‍රතිචාර දැක්විය හැකි වීම ය.
(4) සමාජ පිළිගැනීමක් ලබා ගත හැකි වීම ය.

**37.** ව්‍යාපාරයකට ලබාදෙන මූල්‍යමය **නොවන** දිරිගැන්වීමක් වන්නේ
(1) සහන පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් ලබා දීමයි.
(2) ඉහළ ලාභ ඉපයීම සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කිරීමයි.
(3) ණය ආපසු ගෙවීම් කාල සීමාව වැඩි කිරීමයි.
(4) ඇපකරුවන් රහිතව ණය ලබාදීමයි.

**38.** සීමා සහිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීමෙන් පසු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන ලියවිල්ල වන්නේ
(1) සාංගමික ව්‍යවස්ථාවලියයි. (2) සංස්ථාපන සහතිකයයි.
(3) සාංගමික සංස්ථා පත්‍රයයි. (4) ව්‍යාපාර ලියාපදිංචි සහතිකයයි.

**39.** ව්‍යාපාර ලෝකයේ පවතින භාණ්ඩවල ස්වරූපය වෙනස් වෙමින් නව භාණ්ඩ වෙළෙඳපොළ තුළ සුලභවීමට හේතුවක් වන්නේ
(1) වුවමනා ශීඝ්‍රයෙන් වෙනස් වීම ය.
(2) පරිසරය ශීඝ්‍රයෙන් වෙනස් වීම ය.
(3) අවශ්‍යතා ශීඝ්‍රයෙන් වෙනස් වීම ය.
(4) ව්‍යාපාර සංවිධාන ශීඝ්‍රයෙන් වෙනස් වීම ය.

**40.** නගරයක සිටින පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 75 000කි. සිසුන් 50 000ක් පාසල් බෑගයක් භාවිත කරන බව උපකල්පනය කෙරේ. මෙයින් 60% පාසල් මගින් ද 10% තරගකාරී ආයතන මගින් ද සම්පූර්ණ කරනු ලැබේ. මෙහි වෙළෙඳපොළ හිඩැස,
(1) 12 500 කි. (2) 15 000 කි. (3) 20 000 කි. (4) 30 000 කි.

* *

[පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II
முயற்சியாண்மைக் கற்கை I, II
Entrepreneurship Studies I, II

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පීරිස් මහතා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ ස්ථිර සේවකයෙකි. ඔහුගේ සේවා කාලය අවුරුදු 20කි. පීරිස් මහතා රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වී තමාගේ ම මුද්‍රණ ආයතනයක් පවත්වාගෙන යාමට තීරණය කළේ ය. මේ සඳහා තම ඉතිරිකර ගත් රුපියල් 1500 000ක මුදලක් සහ 10%ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ බැංකුවෙන් ලබා ගැනීමට අපේක්ෂා කරන රුපියල් 1000 000ක මුදල ද ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කිරීමට තීරණය කර ඇත. ඔහු මේ සඳහා අවශ්‍ය ව්‍යාපාර සැලැස්ම සකස්කර, බැංකුවට ඉදිරිපත් කළ ද එහි වූ මූල්‍ය සැලැස්මේ අන්තර්ගත තොරතුරු ප්‍රමාණවත් නොවන බව දන්වමින් බැංකුව ඔහුගේ ණය ඉල්ලුම් පත තාවකාලිකව අත්හිටුවන ලදී. පසුව ව්‍යාපාර උපදේශකවරයකුගේ සහාය ඇතිව අදාළ නිවැරදි තොරතුරු ඇතුළත් කර සකස් කරන ලද මූල්‍ය සැලැස්ම නැවත ඉදිරිපත් කිරීමෙන් පසු ණය මුදල අනුමත කරන ලදී. පීරිස් මහතා තමාගේ නව ව්‍යාපාරය සඳහා පළපුරුදු සේවකයින් පස්දෙනකු බඳවා ගැනීමට ද තීරණය කර ඇත.

(i) රාජ්‍ය අංශයේ රැකියාවක නිරත වීම සහ තමාගේ ම ව්‍යාපාරයක නිරත වීම තුළින් පීරිස් මහතාට ලබා ගත හැකි වාසි හා අවාසි **එක** බැගින් වෙන වෙන ම දක්වන්න.

(ii) පීරිස් මහතාගේ ව්‍යාපාරයට අදාළ ව්‍යාපාරික අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(iii) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමෙන් පීරිස් මහතාට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න.

(iv) පීරිස් මහතා විසින් ඉදිරිපත් කළ මූල්‍ය සැලැස්මේ ඇතුළත් විය යුතු ප්‍රධාන කොටස් මොනවා ද?

(v) ඉහත සඳහන් සිද්ධියට අදාළ ව්‍යාපාරයෙහි ඇල්මැති පාර්ශ්ව **දෙකක්** නම් කරන්න.

● ඉහත සිද්ධියේ සඳහන් පීරිස් මහතාගේ ව්‍යාපාරයේ ඉදිරි වර්ෂයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| විකුණුම් ආදායම | 2 000 000 |
| යන්ත්‍රයක් මිල දී ගැනීම | 1 500 000 |
| කාර්යාල ලී බඩු මිල දී ගැනීම | 40 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 800 000 |
| ශ්‍රම පිරිවැය | 200 000 |
| පරිපාලන වියදම් | 60 000 |
| විකුණුම් වියදම් | 55 000 |
| මූල්‍ය වියදම් (බැංකු ණය පොලිය ඇතුළුව) | 15 000 |

● ඉහත තොරතුරු ඇසුරෙන් පීරිස් මහතාගේ ව්‍යාපාරයේ පහත සඳහන් දෑ ගණනය කර දක්වන්න.

(vi) ඇස්තමේන්තුගත මුළු ආයෝජනය

(vii) ඇස්තමේන්තුගත මුළු මුදල් ගලා ඒම්

(viii) ඇස්තමේන්තුගත මුළු මුදල් ගලා යාම්

(ix) ඇස්තමේන්තු ගත මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම

(x) අපේක්ෂිත ශුද්ධ ලාභය

(ලකුණු 02 × 10 = 20 යි)

[හයවැනි පිටුව බලන්න.

**2.** (i) 'ව්‍යවසායකත්වය' යන්න ව්‍යාපාරික දෘෂ්ටි කෝණයෙන් පැහැදිලි කරන්න.
(ii) නිෂ්පාදන සාධක අතර ව්‍යවසායකත්වයේ ඇති වැදගත්කම දක්වන්න.
(iii) වර්තමානයේදී දැකිය හැකි නවෝත්පාදන සඳහා නිදසුන් **හතරක්** ලියන්න.
(iv) ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් වූ 'නම්‍යශීලිත්වය' යනු කුමක් ද?
(v) අමිල නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඔහුට අනුගමනය කළ හැකි සාර්ථක පිවිසුම් උපාය මාර්ග **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

**3.** (i) ව්‍යාපාර සංවිධානයකින් ඉටුකරනු ලබන කාර්ය **දෙකක්** සඳහන් කරන්න.
(ii) සීමාසහිත පෞද්ගලික සමාගම් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයින් අතර ජනප්‍රිය වීමට හේතු වී ඇති කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(iii) වර්තමානයේ බොහෝ කුඩා පරිමාණ ව්‍යාපාර විවිධ හේතු මත අසාර්ථක වේ. කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **හතරක්** යෝජනා කරන්න.
(iv) අමල් සාර්ථක ව්‍යවසායකයෙකි. ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ව්‍යවසායකයකු ලෙස ඔහුගේ භූමිකා **දෙකක්** නම් කර, ඒ එකිනෙක සඳහා නිදසුන බැගින් සඳහන් කරන්න.
(v) කුඩා පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසායකත්වය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

**4.** (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ව්‍යවසායකත්ව ව්‍යාපාර ආයතන ප්‍රධාන අංශ තුනක් යටතේ වර්ග කෙරේ. එයින් **දෙකක්** නම් කර, එකිනෙක සඳහා නිදසුන බැගින් දෙන්න.
(ii) ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ව්‍යවසායකයින් හට ප්‍රයෝජනයට ගත හැකි සම්පත් වර්ග කළ හැකි ප්‍රධාන ආකාර **දෙක** නම් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) පරිසර ප්‍රවණතා පිළිබඳ සැලකිලිමත් වීමෙන් ව්‍යවසායකයකුට ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න.
(iv) ලාභය අරමුණ කර නොගත් ව්‍යාපාර සංවිධානයක් වන 'රජයේ රෝහල' නිදසුනක් ලෙස ගනිමින් එහි ශක්තියක්, දුර්වලතාවයක්, අවස්ථාවක් හා තර්ජනයක් දක්වන්න.
(v) ව්‍යවසායකයකුට ආර්ථික පරිසරය විශ්ලේෂණය කිරීමෙන් ලබාගත හැකි තොරතුරු **හතරක්** දක්වන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

**5.** (i) ව්‍යවසායකයකුට වෙළෙඳපොළ අලෙවිය සඳහා නිෂ්පාදිතයන් ඉදිරිපත් කළ හැකි ආකාර **දෙකක්** ලියන්න.
(ii) වෙළෙඳපොළ විශ්ලේෂණයක් තුළින් ව්‍යවසායකයකුට රැස්කර ගත හැකි තොරතුරු **හතරක්** සඳහන් කරන්න.
(iii) ඉලක්කගත පාරිභෝගික කණ්ඩායම හඳුනාගැනීම සඳහා යොදාගත හැකි නිර්ණායක **හතරක්** ලියන්න.
(iv) අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගනු ලබන යෙදවුම් වර්ග **හතරක්** සඳහන් කරන්න.
(v) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහිකිරීම සඳහා යොදාගත හැකි මූල්‍යමය දිරිගැන්වීම් සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

**6.** (i) විධායක සාරාංශයක අන්තර් ගත කරුණු **හතරක්** දක්වන්න.
(ii) ව්‍යාපාරයක් සඳහා සකස් කරනු ලබන පරිපාලන සැලැස්මක අවශ්‍යතාවය පැහැදිලි කරන්න.
(iii) ව්‍යවසායකයකුට තම භාණ්ඩය හෝ සේවාව අදාළ පාරිභෝගිකයා වෙත ලබා දීම සඳහා අනුගමනය කළ හැකි උචිත උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න.
(iv) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දරන වියදම් සඳහා උදාහරණ **හතරක්** දක්වන්න.
(v) ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී ඉටුකළ යුතු නීතිමය වගකීම් **දෙකක්** ලියන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

**7.** මිහිරිගේ ව්‍යාපාරයේ මාසයක් සඳහා අපේක්ෂිත ආදායම් හා වියදම් පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| විකුණුම් ආදායම | 250 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 90 000 |
| ශ්‍රම පිරිවැය | 30 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 10 000 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | 35 000 |
| පරිපාලන වියදම් | 40 000 |
| මූල්‍ය වියදම් | 5 000 |

**අවශ්‍ය වන්නේ :**

මිහිරිගේ ව්‍යාපාරයේ පළමු මාසය සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කර, **මුළු නිෂ්පාදන පිරිවැය, මුළු නිෂ්පාදන නොවන පිරිවැය** හා **ශුද්ධ ලාභය** දැක්වීම. (ලකුණු 10 යි)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
# க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

| විෂයය අංකය<br>பாட இலக்கம் | 63 | විෂයය<br>பாடம் | ව්‍යවසායකත්ව අධ්‍යයනය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 1 | 31. | 1 |
| 02. | 3 | 12. | 2 | 22. | 4 | 32. | 1 |
| 03. | 3 | 13. | 4 | 23. | 3 | 33. | 4 |
| 04. | 1 | 14. | 1 | 24. | 4 | 34. | 4 |
| 05. | 3 | 15. | 4 | 25. | 1 | 35. | 1 |
| 06. | 2 | 16. | 3 | 26. | 3 | 36. | 3 |
| 07. | 1 | 17. | 2 | 27. | 4 | 37. | 2 |
| 08. | 4 | 18. | 1 | 28. | 2 | 38. | 2 |
| 09. | 3 | 19. | 3 | 29. | 4 | 39. | 1 |
| 10. | 2 | 20. | 3 | 30. | 2 | 40. | 2 |

PADANAMA PUBLICATION

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |
|---|---|---|---|

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පීරිස් මහතා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ ස්ථිර සේවකයෙකි. ඔහුගේ සේවා කාලය අවුරුදු 20කි. පීරිස් මහතා රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වී තමාගේ ම මුද්‍රණ ආයතනයක් පවත්වාගෙන යාමට තීරණය කළේ ය. මේ සඳහා තම ඉතිරිකර ගත් රුපියල් 1500 000ක මුදලක් සහ 10%ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ බැංකුවෙන් ලබා ගැනීමට අපේක්ෂා කරන රුපියල් 1000 000ක මුදල ද ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කිරීමට තීරණය කර ඇත. ඔහු මේ සඳහා අවශ්‍ය ව්‍යාපාර සැලැස්ම සකස්කර, බැංකුවට ඉදිරිපත් කළ ද එහි වූ මූල්‍ය සැලැස්මේ අන්තර්ගත තොරතුරු ප්‍රමාණවත් නොවන බව දන්වමින් බැංකුව ඔහුගේ ණය ඉල්ලුම් පත තාවකාලිකව අත්හිටුවන ලදී. පසුව ව්‍යාපාර උපදේශකවරයකුගේ සහාය ඇතිව අදාළ නිවැරදි තොරතුරු ඇතුළත් කර සකස් කරන ලද මූල්‍ය සැලැස්ම නැවත ඉදිරිපත් කිරීමෙන් පසු ණය මුදල අනුමත කරන ලදී. පීරිස් මහතා තමාගේ නව ව්‍යාපාරය සඳහා පළපුරුදු සේවකයින් පස්දෙනකු බඳවා ගැනීමට ද තීරණය කර ඇත.

(i) රාජ්‍ය අංශයේ රැකියාවක නිරත වීම සහ තමාගේ ම ව්‍යාපාරයක නිරත වීම තුළින් පීරිස් මහතාට ලබා ගත හැකි වාසි හා අවාසි **එක** බැගින් වෙන වෙන ම දක්වන්න.

(ii) පීරිස් මහතාගේ ව්‍යාපාරයට අදාළ ව්‍යාපාරික අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(iii) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමෙන් පීරිස් මහතාට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න.

(iv) පීරිස් මහතා විසින් ඉදිරිපත් කළ මූල්‍ය සැලැස්මේ ඇතුළත් විය යුතු ප්‍රධාන කොටස් මොනවා ද?

(v) ඉහත සඳහන් සිද්ධියට අදාළ ව්‍යාපාරයෙහි ඇල්මැති පාර්ශ්ව **දෙකක්** නම් කරන්න.

- ඉහත සිද්ධියේ සඳහන් පීරිස් මහතාගේ ව්‍යාපාරයේ ඉදිරි වර්ෂයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| විකුණුම් ආදායම | 2 000 000 |
| යන්ත්‍රයක් මිල දී ගැනීම | 1 500 000 |
| කාර්යාල ලී බඩු මිල දී ගැනීම | 40 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 800 000 |
| ශ්‍රම පිරිවැය | 200 000 |
| පරිපාලන වියදම් | 60 000 |
| විකුණුම් වියදම් | 55 000 |
| මූල්‍ය වියදම් (බැංකු ණය පොලිය ඇතුළුව) | 15 000 |

- ඉහත තොරතුරු ඇසුරෙන් පීරිස් මහතාගේ ව්‍යාපාරයේ පහත සඳහන් දෑ ගණනය කර දක්වන්න.

(vi) ඇස්තමේන්තුගත මුළු ආයෝජනය

(vii) ඇස්තමේන්තුගත මුළු මුදල් ගලා ඒම්

(viii) ඇස්තමේන්තුගත මුළු මුදල් ගලා යාම්

(ix) ඇස්තමේන්තු ගත මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම

(x) අපේක්ෂිත ශුද්ධ ලාභය

(ලකුණු 02 × 10 = 20 යි)

(i) රජයේ රැකියාවක නිරතවීමේ වාසි

- ස්ථිර ආදායමක් ලැබීම
- ඉහළ පිළිගැනීමක් හිමි විම
- අවදානම අඩුවීම
- විශ්‍රාමයාමෙන් පසුව ප්‍රතිලාභ හිමි වීම
- රැකියාවේ සුරක්ෂිත බව/ අඛණ්ඩ පැවැත්මක් තිබීම

***(එක් කරුණකට ලකුණු 1/2 යි)***

***අවාසි***

- ස්වාධීනත්වයක් නැත.
- නීතිරීතිවලට යටත් විය යුතු වීම
- නිදහස සීමා වීම
- යම් පුද්ගලයින් යටතේ සේවයේ නිරත විය යුතු වීම

***(එක් කරුණකට ලකුණු 1/2 යි)***

තමාගේම ව්‍යාපාරයක නිරතවීමේ වාසි

- ලාභය තනිව භුක්ති විදිය හැකි වීම
- සමාජ සුබසාධන කටයුතුවලට දායක විය හැකිවීම
- නිදහස ඉහළ මට්ටමක පැවතීම
- නිර්මාණශීලී චින්තනයෙන් නව නිෂ්පාදන කළ හැකි වීම
- ආකර්ෂණීය ලාභයක් ඉපයිය හැකිවීම

*(එක් කරුණකට ලකුණු 1/2 යි)*

අවාසි

- පාඩු තනිව භුක්ති විදීමට සිදු වීම
- අවදානම ඉහළ වීම
- සමාජයේ පවතින අයහපත් ආකල්ප
- නිදහස අඩුවීම
- සමාජ සම්බන්ධතා අඩුවීම

*(එක් කරුණකට ලකුණු 1/2 යි)*

*මුළු ලකුණු 02*

(ii)

- අතිරේක පන්ති වැඩිවීම නිසා මුද්‍රණ ආයතනවවලට ඇති ඉල්ලුම වැඩිවීම
- මිනිසුන් ලියකියවිලි ඉදිරිපත් කිරීමේ දී මුද්‍රිත ලියවිලි සඳහා ඇති කැමැත්ත වැඩිවීම
- මුද්‍රණ තාක්‍ෂණයේ ඇති දියුණුව නිසා අවම පිරිවැයක් යටතේ මුද්‍රණ කටයුතු කළ හැකිවීම
- අලෙවි ප්‍රවර්ධන ක්‍රම වර්ධනය වීම නිසා මුද්‍රණ කටයුතු සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම

*කරුණු 01කට ලකුණු 01 බැගින් කරුණු 02 කට ලකුණු 02යි)*

(iii)

- තම ව්‍යාපාරය පිළිබඳ අදහස පැහැදිලි කර ගැනීමට
- ව්‍යාපාරය සඳහා මග පෙන්වීම
- ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්වා දීමට
- අරමුදල් සම්පාදනය කර ගැනීමට
- ව්‍යාපරයට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමට
- වෙළඳපොල පිළිබඳ හොඳ තක්සේරුවක් ලබා ගැනීමට / ගණුදෙනුකරුවන් හඳුනා ගැනීමට/ තරගකරුවන් හඳුනා ගැනීමට

*(කරුණු 01කට ලකුණු 01 බැගින් කරුණු 02 කට ලකුණු 02යි)*

(iv)

- ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර කාර්යයන් හා වියදම්
- මුළු ආයෝජන ඇස්තමේන්තුව
- අපේක්ෂිත මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් ලේඛනය
- ව්‍යාපාරය ප්‍රතිඵල ගණනය

*(කරුණු 01කට ලකුණු ½ බැගින් කරුණු 04 ක් සඳහා ලකුණු 02යි)*

(v)

- අයිතිකරු / පීරිස් මහතා
- සේවකයින්
- බැංකුව
- ප්‍රජාව
- සැපයුම්කරුවන්
- ගනුදෙනුකරුවන් / පාරිභෝගිකයින්

*(කරුණු 01කට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02යි)*

(vi) ඇස්තමේන්තුගත මුළු ආයෝජනය :

ඉතිරිකර ගත් මුදල රු . 1 500 000.00

ණය මුදල රු. 1 000 000. 00

රු. 2 500 000.00

(මුළු ආයෝජනය රු. 25, 00000 ගණනය කිරීමකින් තොරව දක්වා තිබුණද ලකුණු 02 ලැබේ.)

(ඉතිරි කර ගත් මුදල රු.15,00000.00 හා ණය මුදල රු. 1000000.00 ලෙස වෙන වෙනම දක්වා එකතුව වැරදි වුවහොත් ඉහත දැක්වීම් 02 ට ලකුණු 01 බැගින් ලබා දෙන්න.)

(vii) ඇස්තමේන්තුගත මුළු මුදල ගලා ඒම් :

ඉතිරිකර ගත් මුදල රු . 1 500 000.00

ණය මුදල රු. 1 000 000. 00

විකුණුම් ආදායම රු. 2 000 000.00

රු. 4 500 000.00

(නිවැරදිව ගණනය කිරීම් සිදු කර ඇත්නම් (රු. 4500000.00) ලකුණු 02)
(ඉහත අයිතම 3 න් 2 ක් නිවැරදිව ලියා ඇත්නම් ලකුණු 01. එක් අයිතමයක් නිවැරදි නම් ලකුණු 1/2 යි)

(viii) ඇස්තමේන්තුගත මුළු මුදල ගලා යාම් :

| | | |
|---|---|---|
| යන්ත්‍රයක් මිලදී ගැනීම | රු . | 1 500 000.00 |
| කාර්යාල ලී බඩු මිලදී ගැනීම | රු. | 40 000. 00 |
| අමුද්‍රව්‍ය පිරිවැය | රු. | 800 000.00 |
| ශ්‍රම පිරිවැය | රු. | 200 000.00 |
| පරිපාලන වියදම් | රු. | 60 000.00 |
| විකුණුම් වියදම් | රු. | 55 000.00 |
| මූල්‍ය වියදම් | රු. | 15 000.00 |
| | රු. | 2 670 000.00 |

*(අයිතම 07 ලකුණු 02)*
*(අයිතම 05 ක් 06 ක් නිවැරදි නම් ලකුණු 01)*
*(අයිතම 03 ක් නිවැරදි නම් ලකුණු 1/2)*
*(අයිතම 02 ක් නිවැදි නම් ලකුණු නැත)*

(ix) <u>ඇස්තමේන්තුගත ස්ථාවර වත්කම්</u>

යන්ත්‍රය 1500000.00

කාර්යාල ලී බඩු 40000.00

1540000.00

***(එක් අයිතමයක් නිවැරදි නම් ලකුණු 01 බැගින් අයිතම 02 ට ලකුණු 02 යි)***
***(නිවැරදි පිළිතුර පමණක් ඇත්නම් ලකුණු 02 යි))***

(x) අපේක්ෂිත ශුද්ධ ලාභය = රු. 870 000/- (ලකුණු 02) හෝ

අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් ආදායම | | 2000000 (½) |
| අඩුකළා - <u>මූළු නිෂ්පාදන පිරිවැය</u> | | |
| අමුද්‍රව්‍ය පිරිවැය | 800000 | |
| ශ්‍රම පිරිවැය | 200000 (½) | (1000000.00) |
| | | 1000000.00 |
| අඩුකළා - <u>නිෂ්පාදන නොවන පිරිවැය</u> | | |
| පරිපාලක වියදම් | 60000.00 | |
| විකුණුම් වියදම් | 55000.00 | |
| මූල්‍ය වියදම | 15000.00 (½) | (130000.00) |
| ශුද්ධ ලාභය | | 870 000.00 (½) |

***(මුළු ලකුණු 02 x 10 = 20)***

**2.** (i) 'ව්‍යවසායකත්වය' යන්න ව්‍යාපාරික දෘෂ්ටි කෝණයෙන් පැහැදිලි කරන්න.
(ii) නිෂ්පාදන සාධක අතර ව්‍යවසායකත්වයේ ඇති වැදගත්කම දක්වන්න.
(iii) වර්තමානයේදී දැකිය හැකි නවෝත්පාදන සඳහා නිදසුන් **හතරක්** ලියන්න.
(iv) ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් වූ 'නම්‍යශීලීත්වය' යනු කුමක් ද?
(v) අමිල නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඔහුට අනුගමනය කළ හැකි සාර්ථක පිවිසුම් උපාය මාර්ග **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

(i) ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කර, <u>ව්‍යාපාරික අවස්ථා හඳුනාගෙන</u> අවදානම දරමින් නිර්මාණශීලීත්වය හා නවෝත්පාදන බව තුළින් හඳුනාගත් ව්‍යාපාරික අවස්ථාව <u>ප්‍රායෝගික කටයුත්තක් බවට පත්කිරීමේ</u> හැකියාව ව්‍යවසායකත්වයයි.

***(ඉරි ඇඳි පද 02 ඇතුළත් සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)***
***නිර්මාණශීලීත්වය, නවෝත්පානබව, අවදානම් දැරීම යන කරුණු පමණක් සඳහන් පිළිතුරකට ලකුණු 01)***

(ii)

- භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන සාධක තිබූ පමණින් නිෂ්පාදනයක් සිදු නොවේ. මෙම සාධක අවශ්‍ය පරිදි සංකලනය කර භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර වෙළඳපොලට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යවසායකත්වය අවශ්‍ය වේ. ඉහත දක්වා ඇති නිෂ්පාදන සාධක 03, අජීවී සාධකයන් වන අතර ව්‍යවසායකත්වය යනු සජීවී සාධකයකි.

***(ලකුණු 02)***

(iii)

නව නිෂ්පාදිතයක්, දිගුවක්, ක්‍රමයක්, සංකලනයක්, විද්‍යුත් වාණිජ ක්‍රම දක්වා ඇත්නම්

*(එක් කරුණකට ලකුණු $^1/_2$ බැගින් කරුණු 4 කට ලකුණු 02 යි)*

(iv) පරිසරයේ වෙනස්වීම්වලට උචිත වන පරිදි අනුගත වීමට ඇති හැකියාව නම්‍යශීලීත්වයයි.

*(ලකුණු 02 යි)*

(v)

- සුවිශේෂී නව භාණ්ඩයක් හෝ සේවාවක් හඳුන්වා දීම
- නිෂ්පාදිත ප්‍රභේදනයන් හඳුන්වා දීම
- වෙළඳපොල හිඩැස/ අවකාශය සඳහා භාණ්ඩ හඳුන්වා දීම
- නවෝත්පාදනයන් කිරීම

*(එක් කරුණකට 01 බැගින් කරුණු 2 කට ලකුණු 02 යි)*

*(මුළු ලකුණු* **02 x 5 = 10***)*

**3.** (i) ව්‍යාපාර සංවිධානයකින් ඉටුකරනු ලබන කාර්ය **දෙකක්** සඳහන් කරන්න.

(ii) සීමාසහිත පෞද්ගලික සමාගම් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයින් අතර ජනප්‍රිය වීමට හේතු වී ඇති කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(iii) වර්තමානයේ බොහෝ කුඩා පරිමාණ ව්‍යාපාර විවිධ හේතු මත අසාර්ථක වේ. කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **හතරක්** යෝජනා කරන්න.

(iv) අමල් සාර්ථක ව්‍යවසායකයෙකි. ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ව්‍යවසායකයකු ලෙස ඔහුගේ භූමිකා **දෙකක්** නම් කර, ඒ එකිනෙක සඳහා නිදසුන බැගින් සඳහන් කරන්න.

(v) කුඩා පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසායකත්වය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(i)

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම
- රැකියා අවස්ථා උත්පාදනය කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනයක් සිදු වීම / ප්‍රාදේශීය සම්පත් භාවිතා කිරීම
- සමාජීය සුබ සාධනය
- ආර්ථික සංවර්ධනයට දායක වීම
- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම
- භාණ්ඩ බෙදා හැරීමේ කාර්යයේ නිරත වීම

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02 කට ලකුණු 02 යි)*

(ii)

- එක් පුද්ගලයෙකුට වුවද ආරම්භ කළ හැකිවීම
- වගකීම් සීමිතවීම
- අඛණ්ඩ පැවැත්මක් තිබීම
- නෛතික පුද්ගලභාවයක් හිමිවීම
- පවුලේ සාමාජිකයින්, නෑදෑ හිතමිතුරන් සම්බන්ධ කර ගත හැකි වීම

**( එක් කරුණකට ලකුණු** 01 **බැගින් කරුණු** 02 **කට සඳහා ලකුණු** 02 **යි**

(iii)

- ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීම
- යහපත් මානව සම්බන්ධතා පවත්වා ගැනීම
- ප්‍රවීණයන්ගෙන් අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් ලබා ගැනීම
- ව්‍යාපාරික කටයුතු සඳහා නිවැරදි සැලසුම් සැකසීම
- ඒවාට අනුව ක්‍රියාත්මක වීම
- බාහිර පරිසරයේ ඇති වෙනස්වීම් හඳුනාගැනීම හා අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම
- ව්‍යාපාරිකයාගේ පෞද්ගලික ජීවිතය ව්‍යාපාර කටයුතුවලින් වෙන් කොට තැබීම
- රාජ්‍ය ආයතනවල සහාය ලබා ගැනීම
  (වෙළඳපල පහසුකම්, ණය පහසුකම්, පර්යේෂණ ආදී කාර්යයන්ට උදව්වන)

**(එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04 ට ලකුණු 02)**

(iv) <u>අයිතිකරුගේ භූමිකාව</u>

- ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් සැපයීම
- අවදානම් දැරීම
- වැදගත් තීරණ ගැනීම
- ලාභ හෝ පාඩු විඳ දරා ගැනීම

<u>කළමනාකරුගේ භූමිකාව</u>

- ව්‍යාපාර සැලසුම් සකස් කිරීම
- සැලසුමට අනුව කටයුතු සිදුවනවාදැයි විමසා බැලීම

<u>නායකයාගේ භූමිකාව</u>

- සේවකයින් පෙළඹවීම
- අවශ්‍ය මග පෙන්වීම
- කාර්යය ඉටු කිරීමේ දී සේවකියින් මෙහෙය වීම

***(භූමිකා 02 සඳහන් කිරීමට ලකුණු 01)***
***(නිදසුන් 01 ලකුණු 1/2 බැගින් ඒ ඒ භූමිකාවට අදාල නිදසුන් 02 සඳහන් කිරීමට ලකුණු 01)***

(v)

- බොහෝ සාර්ථක මහා පරිමාණ ව්‍යාපාරවල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාරයක් වීම
- ව්‍යවසායකයන්ට නිර්මාණශීලී කුසලතා ප්‍රායෝගිකව පහසුවෙන් භාවිත කළ හැකිවීම
- ඒ තුළින් නවෝත්පාදන බිහිවීම
- වෙළඳපොල හිදැස හඳුනාගෙන ව්‍යාපාර අවස්ථා සඳහා පිවිසිය හැකි වීම

***(ඉහත කරුණු 02 ක් වත් ඇතුළත් පිළිතුරකට ලකුණු 02)***
***(කරුණු 10 ක් ඇතුළත් පිළිතුරකට ලකුණු 01 යි)***

***(මුළු ලකුණු 02 x 5 = 10)***

**4.** (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ව්‍යවසායකත්ව ව්‍යාපාර ආයතන ප්‍රධාන අංශ තුනක් යටතේ වර්ග කෙරේ. එයින් **දෙකක්** නම් කර, එකිනෙක සඳහා නිදසුන බැගින් දෙන්න.

(ii) ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ව්‍යවසායකයින් හට ප්‍රයෝජනයට ගත හැකි සම්පත් වර්ග කළ හැකි ප්‍රධාන ආකාර **දෙක** නම් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) පරිසර ප්‍රවණතා පිළිබඳ සැලකිලිමත් වීමෙන් ව්‍යවසායකයකුට ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න.

(iv) ලාභය අරමුණ කර නොගත් ව්‍යාපාර සංවිධානයක් වන 'රජයේ රෝහල' නිදසුනක් ලෙස ගනිමින් එහි ශක්තියක්, දුර්වලතාවයක්, අවස්ථාවක් හා තර්ජනයක් දක්වන්න.

(v) ව්‍යවසායකයකුට ආර්ථික පරිසරය විශ්ලේෂණය කිරීමෙන් ලබාගත හැකි තොරතුරු **හතරක්** දක්වන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

- ප්‍රාථමික අංශය

  නිදසුන් : කෘෂි හා ගොවිපළ කර්මාන්තය/ මල් වගාව/ දැව කර්මාන්තය/ සත්ත්ව පාලනය

- ද්විතියික අංශය

  නිදසුන් :

  නිමැවුම් (සපත්තු/ පොත්පත් ආදී)

  ඉදිකිරීම් (ගොඩනැගිලි, පාලම් ආදී)

- තෘතියික අංශය

  නිදසුන් :

  වෙළඳාම / තොග හා සිල්ලර වෙළඳාම

  වෙළඳාමට අවශ්‍ය උපකාරක සේවා / බැංකු/ රක්ෂණ/ ප්‍රවාහන ආදී

**(අංශ නම් කිරීමට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 01 යි)**

**(අදාළ අංශ සඳහා නිදසුන් 02 කට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 01 යි**

(i) මානව සම්පත්

- ව්‍යාපාර කටයුතුවල නිරතවන කළමනාකරුවන් හා කළමනාකරුවන් නොවන සේවකයින් මානව සම්පත් ලෙස හැඳින්වේ.

මානව නොවන සම්පත්

- ව්‍යාපාර කාර්යයන් සඳහා යොදා ගනු ලබන මානව සම්පත් නොවන ස්වභාවික සම්පත් හා මිනිසා විසින් නිර්මාණය කරන ලද සම්පත්

**( නම් කිරීමට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 01 යි)**
**(පැහැදිලි කිරීමට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 01 යි)**

(ii)

01. නව ආදායම් මාර්ග සකස් කර ගැනීමේ හැකියාව වැඩි කර ගැනීම
02. තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දීම
03. පරිසරය තුළ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සම්පත් භාවිතය
04. ව්‍යාපාරික අවස්ථා ග්‍රහණය කර ගැනීම
05. පාරිසරික ගැටළු අවම කර ගැනීම
06. අර්ථක්‍රමය තුළ අවශ්‍යයෙන්ම ඉටු කර ගත යුතු සංවර්ධන ක්‍රියාදාමයන් මතු කර ගැනීම
07. ආවේණික සම්පත් සුරැකීම හා අනාගතය සඳහා සම්පත් ඉතිරි කරගැනීම

**( ප්‍රයෝජන 04 සඳහන් කිරීම සඳහා ලකුණු $^1/_2$ බැගින් ලකුණු 02 යි)**

(iii) ශක්තීන්

01. දක්ෂ වෛද්‍යවරුන් හා හෙදියන් සිටීම.

02. ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පැවතීම.

03. නවීන උපකරණ පැවතීම.

04. ප්‍රමාණවත් භෞතික සම්පත් පැවතීම.

(කරුණු 01 ට ලකුණු $^1/_2$ යි)

දුර්වලතා

01. සේවකයින්ගේ කැපවීම හා දක්ෂතා ප්‍රමාණවත් නොවීම.

02. අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණවත් නොවීම.

03. අවශ්‍ය උපකරණ නොමැති වීම හෝ උපකරණ අක්‍රිය වීම.

04. භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම.

05. සේවකයින් වැඩ වර්ජනයන්හි නිරතවීම.

(කරුණු 01 ට ලකුණු $^1/_2$ යි)

අවස්ථා

- ❖ සමාජ සුබ සාධන කටයුතු සඳහා කරනු ලබන කටයුතු රජයේ රෝහල් කෙරෙහි යොමුවීම.
- ❖ රජයේ රෝහල්වලට වෛද්‍යවරුන් යොමුකරන රජයේ ක්‍රමවේදයක් පැවතීම.
- ❖ හෙද විදුහල්වලින් පුහුණු හෙදියන් ලබාගැනීමට හැකිවීම.
- ❖ රජයේ රෝහල් පිළිබඳ ජනතාව තුළ පවතින ඉහළ විශ්වාසය.

(කරුණු 01 ට ලකුණු $^1/_2$ යි)

තර්ජන

- ❖ රජය විසින් රජයේ රෝහල් සඳහා වෙන්කරනු ලබන මුදල් ප්‍රමාණවත් නොවීම.
- ❖ පෞද්ගලික රෝහල්වලින් එල්ලවන තරඟය
- ❖ රජයේ රෝහල්වලින් ලබා දෙනු ලබන සේවය පිළිබඳ ජනතාව තුල යහපත් ආකල්ප නොමැති වීම.
- ❖ වැඩවර්ජනයන් හි නිරතවීම.

(කරුණු 01 ට ලකුණු $^1/_2$ යි)

(iv)

01. පොළී අනුපාතිකය අඩු වැඩි වීම.

02. මිල මට්ටම්වල වෙනස් වීම.

03. සේවා නියුක්තිය.

04. වැටුප් මට්ටම්.

05. විදේශ විනිමය අනුපාතිකය.

**(කරුණු 04 ට ලකුණු 02 යි)**

***(මුළු ලකුණු 02 x 5 = 10)***

**5.** (i) ව්‍යවසායකයකුට වෙළෙඳපොළ අලෙවිය සඳහා නිෂ්පාදිතයන් ඉදිරිපත් කළ හැකි ආකාර **දෙකක්** ලියන්න.
(ii) වෙළෙඳපොළ විශ්ලේෂණයක් තුළින් ව්‍යවසායකයකුට රැස්කර ගත හැකි තොරතුරු **හතරක්** සඳහන් කරන්න.
(iii) ඉලක්කගත පාරිභෝගික කණ්ඩායම හඳුනාගැනීම සඳහා යොදාගත හැකි නිර්ණායක **හතරක්** ලියන්න.
(iv) අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගනු ලබන යෙදවුම් වර්ග **හතරක්** සඳහන් කරන්න.
(v) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහිකිරීම සඳහා යොදාගත හැකි මූල්‍යමය දිරිගැන්වීම් සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

(i) 01. පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම.

02. පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම.

03. නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම.

04. නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම.

**(කරුණු 02 ක් සඳහා ලකුණු 02 යි)**

(ii) 01. භාණ්ඩය හෝ සේවාව සඳහා ඇති ඉල්ලුම

02. ඉලක්කගත පාරිභෝගිකයන්

03. තරඟකරුවන්ගේ ස්වභාවය / ගණන / ශක්තීන් / දුර්වලතා

04. තරඟකරුවන්ගේ අලෙවි උපක්‍රම

05. භාණ්ඩවල මිල, නිෂ්පාදිතය, ස්ථානය, ප්‍රවර්ධනය

06. වෙළෙඳපොල ව්‍යුහය

**(කරුණු 04 ක් සඳහා ලකුණු 1/2 බැගින් ලකුණු 02)**

(iii) 01. පාරිභෝගිකයාගේ වයස

02. පාරිභෝගික ආදායම

03. ස්ත්‍රී / පුරුෂ භාවය

04. රැකියාව

05. සමාජ තත්ත්වය

**(කරුණු 04 ක් සඳහා ලකුණු 1/2 බැගින් ලකුණු 02)**

(iv)
- ★ කඩදාසි
- ★ තීන්ත
- ★ ගම්
- ★ නූල්
- ★ පිටකවර
- ★ ස්ටෙප්ලර් කටු
- ★ මිනිස් ශ්‍රමය
- ★ කාලය
- ★ දැනුම
- ★ තොරතුරු

**(යෙදවුම් වර්ග 4 ක් සඳහා ලකුණු 1/2 බැගින් ලකුණු 02)**

(v) 01. සහන පදනම යටතේ ණය ලබාදීම.

02. ඇප සුරැකුම් රහිත ණය ලබාදීම.

03. ණය ආපසු ගෙවීමේ කාල සීමාව වැඩිකිරීම.

04. මූල්‍යමය ප්‍රදාන / ආධාර.

05. බදු සහන.

**(කරුණු 02 ක් දැක්වීමට ලකුණු 02)**

**6.** (i) විධායක සාරාංශයක අන්තර් ගත කරුණු **හතරක්** දක්වන්න.

(ii) ව්‍යාපාරයක් සඳහා සකස් කරනු ලබන පරිපාලන සැලැස්මක අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

(iii) ව්‍යවසායකයකුට තම භාණ්ඩය හෝ සේවාව අදාළ පාරිභෝගිකයා වෙත ලබා දීම සඳහා අනුගමනය කළ හැකි උචිත උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(iv) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දරන වියදම් සඳහා උදාහරණ **හතරක්** දක්වන්න.

(v) ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී ඉටුකළ යුතු නීතිමය වගකීම් **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

(i) ★ ව්‍යාපාරයේ නව කර්මාන්ත ක්ෂේත්‍රය කුමක්ද යන්න ඉතා කෙටියෙන්

★ අලෙවිකරණ සැලසුමේ ඉතාම වැදගත් කරුණු මතු කරමින් එහි සාරාංශය

★ නිෂ්පාදන සැලසුමේ ඉතාම වැදගත් කරුණු මතුකරමින් එහි සාරාංශය

★ පරිපාලන සැලසුමේ ඉතාම වැදගත් කරුණු මතුකරමින් එහි සාරාංශය

★ මූල්‍ය සැලසුමේ ඉතාම වැදගත් කරුණු මතුකරමින් එහි සාරාංශය

★ ව්‍යාපාරයේ සුවිශේෂීභාවය ඉතා කෙටියෙන්

★ ව්‍යාපාර සැලසුම සකස්කර ඉදිරිපත් කිරීමේ පරමාර්ථ හා අරමුණු කෙටියෙන්

**(කරුණු එකකට $^1/_2$ බැගින් කරුණු** 04 **සඳහා ලකුණු** 02**)**

(ii) ව්‍යාපාරයක කටයුතු මෙහෙයවීම සඳහා මානව සම්පත අත්‍යවශ්‍ය වේ. ව්‍යාපාරයේ පරිපාලනමය තනතුරු හා කාර්යයන් හා මානව සම්පත් පිළිබඳ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා පරිපාලන සැලැස්මක් අවශ්‍ය වේ.

**(මානව සම්පත පිළිබඳව සටහන්ව ඇත්නම් ලකුණු 02)**

(iii) ★ ගැණුම්කරුවන් පෞද්ගලිකව මුණගැසී භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කිරීම.

★ නව තාක්ෂණය භාවිතාකොට අන්තර්ජාලයේ වෙබ් අඩවි, මුහුණු පොත (face book) වැනි ප්‍රචාරණ උපක්‍රම භාවිතය.

★ අතරමැදියන් යොදාගෙන භාණ්ඩ අලෙවිය, (සිල්ලර වෙළෙන්දා, නියෝජිතයන්)

**(කරුණු 01 කට ලකුණු 01 බැගින් කරුණු 2 කට ලකුණු 02)**

(iv) 01. වෙළෙඳපල සමීක්ෂණ වියදම්

02. ස්ථානය සංවර්ධනය සඳහා වන වියදම්

03. අමුද්‍රව්‍ය හා උපකරණ සොයා බැලීම සඳහා වන වියදම්

04. ලියාපදිංචි කිරීම සඳහා වන වියදම්

05. ව්‍යාපාර සැලැස්ම සකස් කිරීමට යන වියදම්

06. ආරම්භක දින උත්සව වියදම්

**(උදාහරණ එකක් සඳහා ලකුණු** $^{1}/_{2}$ **බැගින් හතරක් සඳහා ලකුණු 02)**

(v) ★ සේවක අර්ථ සාධක අරමුදල් නිසිපරිදි ගෙවීම.

★ පරිසර දූෂණය අවම කිරීම.

★ තහනම් කළ අමුද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම.

★ ඇසුරුම්වල අඩංගු කළ යුතු කරුණු ඇතුළත් කිරීම

උදා : නිෂ්පාදිත දිනය, කල්ඉකුත් වීමේ දිනය

★ රජයට ගෙවිය යුතු බදු මුදල් ගෙවීම

★ අවශ්‍ය බලපත්‍ර ලබා ගැනීම

**(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

***(මුළු ලකුණු 02 x 5 = 10)***

**7.** මිහිරිගේ ව්‍යාපාරයේ මාසයක් සඳහා අපේක්ෂිත ආදායම් හා වියදම් පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| විකුණුම් ආදායම | 250 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 90 000 |
| ශ්‍රම පිරිවැය | 30 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 10 000 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | 35 000 |
| පරිපාලන වියදම් | 40 000 |
| මූල්‍ය වියදම් | 5 000 |

**අවශ්‍ය වන්නේ :**

මිහිරිගේ ව්‍යාපාරයේ පළමු මාසය සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කර, **මුළු නිෂ්පාදන පිරිවැය, මුළු නිෂ්පාදන නොවන පිරිවැය** හා **ශුද්ධ ලාභය** දැක්වීම. (ලකුණු 10 යි)

මිහිරිගේ ව්‍යාපාරයේ
පළමු මාසය සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය (ලකුණු 01)

| | | |
|---|---|---|
| විකුණුම් ආදායම (½) | | 250000 (½) |
| අඩු කළා :- | | |
| මුළු නිෂ්පාදන පිරිවැය (01) | | |
| අමුද්‍රව්‍ය පිරිවැය | 90000 (½) | |
| ශ්‍රම පිරිවැය | 30000 (½) | |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 10000 (½) | (130000) (01) |
| | | 120000 |
| අඩු කළා :- | | |
| නිෂ්පාදන නොවන පිරිවැය (01) | | |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 35000 (½) | |
| පරිපාලන වියදම් | 40000 (½) | |
| මූල්‍ය වියදම් | 5000 (½) | 80000 (01) |
| ශුද්ධ ලාභය (½) | | 40000 (½) |

**(ලකුණු 10 යි)**

**(මුළු නිෂ්පාදන පිරිවැය හා මුළු නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කිරීම් පමණක් ඇත්නම් ලකුණු 01)**

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- ☐ 10-11 සිංහල ව්‍යාකරණ
- ☐ 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- ☐ බුද්ධ ධර්මය
- ☐ කතෝලික ධර්මය
- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ සිංහල සාහිත්‍යය සංග්‍රහය
- ☐ English Language
- ☐ ගණිතය - 1
- ☐ ගණිතය - 2
- ☐ ජීව විද්‍යාව
- ☐ භෞතික විද්‍යාව
- ☐ රසායන විද්‍යාව
- ☐ ඉතිහාසය
- ☐ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- ☐ භූගෝල විද්‍යාව
- ☐ පුරවැසි අධ්‍යාපනය
- ☐ පෙරදිග සංගීතය
- ☐ නර්තනය
- ☐ නාට්‍ය හා රංග කලාව
- ☐ චිත්‍ර කලාව
- ☐ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ☐ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ☐ සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- ☐ කෘෂි හා ආහාර තාක්ෂණය
- ☐ ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ බුද්ධ ධර්මය
- ☐ ඉතිහාසය
- ☐ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- ☐ පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- ☐ Buddhism
- ☐ Mathematics - 1
- ☐ Mathematics - 2
- ☐ Biology
- ☐ Physics
- ☐ Chemistry
- ☐ History
- ☐ Business & Accounting Studies
- ☐ Geography
- ☐ Civic Education
- ☐ ICT
- ☐ Health & Physical Education
- ☐ 10-11 English Literary (Poetry)
- ☐ 10-11 English Literary (Drama)
- ☐ 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- ☐ Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- ☐ බුද්ධ ධර්මය
- ☐ කතෝලික ධර්මය
- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ සිංහල සාහිත්‍යය සංග්‍රහය
- ☐ සිංහල රචනා අත්වැල
- ☐ English Language
- ☐ ගණිතය - 1
- ☐ ගණිතය - 2
- ☐ ජීව විද්‍යාව
- ☐ භෞතික විද්‍යාව
- ☐ රසායන විද්‍යාව

PADANAMA PUBLICATION

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකදුරන් - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.